සුබස් සිතිවිලි

දෙලහ - උඩහ සහ පල්ලහ (පල්ලෙහා)

වි ක ධර්මබන්ධු

සොයා ගත යුත යුතු හෝ අවතැන් වූ යමක් හෝ යමකු අස්සක් මුල්ලක් නෑර සෙවීම අපේ සිරිතයි. - බෝලෙ ගල් / ගස් බැද්දද අස්සට වැටුනා" යන්නේ "අස්ස" යනු "අතර /පැත්ත / ආශ්‍රය" යන තේරුම දෙන්නකි. "දෙගල් අස්ස, ගල් අතර" යනුවෙන් ගම් දෙකක් ගැන ද අසා ඇත්තෙමි. "කැරලි කාරයො වෙල් අස්සෙං මතු උනා/ වෙල් අස්සට පසු බැස්සා / වෙල් අස්සෙ හැංගුනා" යන වාක්‍ය තුනේ ඇති - අස්සේ" ඇත්තේ "අතර / පල්ල/ පැත්ත / ආශ්‍රය යන තේරුමිය. වෙල්ලස්ස යනු වෙල්ලස්සය (ලක්සය) බව කියමින් සමහරු සුන්දර සිහින දකිති.

"පල්ල" යන්නේ අස්ස / පතුල / පහළ යන තේරුම් තුනක් ඇති බව පෙනේ. මා නොදන්නා වෙනත් තේරුම් එහි තිබෙන්නටත් පුලුවන. " තාත්ත:ඳ තාත්ත:මේ දැං පහලට ගියා / පල්ලහට (පල්ලෙහාට) ගියා. "අහ" යනු පැත්තයි. නොහොත් දිසාව / දිහාව/ දිහැයි. පල්ල අහ - පල්ලාහ - පල්ලහා - පල්ලෙහා යනුවෙනි, ඒප දය දිගාරින්ං. හෙවත් විදහන්නේ. මේ "පල්ලෙහා" යන්නේ ඇත්තේ පහල - පහල පැත්ත යන තේරුමයි. එහි විරුදුව (විරුද්ද වචනය) උඩ අහ - උඩහයි.

"පහිට්ටුවෙ පල්ල ගිල් වෙලඃ කලගෙඩිය ලිඳට වැටුනඃ දැං කලගෙඩි දෙකක් ම ලිඳ පල්ලෙ (පතුලෙ). ගඟ පතුලෙං (පල්ලෙං) ගොඩට ගත්තු බය්සිකලේ ගන්න දෙයක් නෑ; මලකඩ කාලඃ" යන වැකකි තුනේ ඇත්තේ පතුල / පත්ල යන තේරුමයි.

"මීයඃ වලං පල්ලෙ හැංගුනඃ - හුලඟ වෙලාම ඔය පොල් ගස් පල්ලෙ යන්න එපා දරුවනේ" යන වැකකි දෙකේ ඇත්තේ අස්ස, අතර යන තේරුමයි. මට මෙහිදී වැදගත් වන්නේ -පල්ල" යනුවෙන් වෙනස් වී ඇති -පහල" යන පදයයි.

තොරං / තොරණ් යන වචන ඉතා හොඳින් උච්චාරනය කල හැකිය. ත් - න සහ ළ - ල යන අකුරු අපට කියවෙන්නේ ඉතාමත් කලාතුරකිනි. දිව දත්වල ගාවමින් "නොන්නො නෝන නාන්නඃ !" " බල්ලඃ පොල්ලෙල්ල ලෝනව" යන වැකි දෙක කියවා ඉන්පසු දිව උඩුතල්ලේ ගාවමින් "

ණොණ්ණො ණෝණ ණාණ්ණඃ / බළ්ළඃ පොල් ළෙල්ළ ළෝණව" යන වැනි දෙකත් කියවන්න. මුල් දෙවැකිය කියවන විට කටට දැනෙන වෙහෙස හෙවත් ගාය හොඳින් තේරුම් ගන්න. දෙවන දෙවැකිය කියවන විට කටට දැනෙන මුදුව (මුදු බව) හෙවත් පහසුවත් හොඳින් තේරුම් ගන්න.

ඇත්තේ හැටියට ම මට හොඳින් නිවැරදිව කිය-වෙන "ණ - ළ - ෂ" යන අකුරු මා නොලියන්නේ " න - ල - ශ" යන අකුරු තුන පහසුවෙන් සහ ඉක්මනින් ලිවිය හැකි නිසා මිස ඒ අකුරුවල නිවැරදිතාව සලසා නොවේ.

"පොල්ලෙබැද්ද" යන ගමනම දිග ඇරෙන්නේ" පහල බැද්ද - පල්ලෙ බැද්ද - පොල්ලෙබැද්ද" යනුවෙනි. (පහල) පල්ලෙවෙල (පහල) පල්ලෙ කන්ද (මේ නම මට හොඳින් මතකය. ගැටහැත්තේ විදුහලක, -පල්ලෙකන්දෙගේ" යන පෙළපත් නම ඇති සිසු දැරියක් වුන. මා මගේ අකුරු ඉංගිරිසි විදියට නොලියා අපේ විදියට "වි. ක." යනුවෙන් ලියන නිසා මා අනුයමින් තමන්ගේ මුලකුරු ලිවීමට ඇයට සිතක් පහල විය. කොහේ ලියන්න ද ? -ප. ක." මටත් ඇයටත් හිනා. "පල්ලෙ කන්ද" ලියන්නේ පද වෙන්කොට නොවේ. උඩගම / පල්ලෙගම යන නම් පද වෙන් කොට ලියන සිරිතක් නැත. -අමර - පාල ගුනවර්දන" ලියන්නේත් " අමරපාල ගුනවර්දන" කියන නොවැ. ඇග් නම " පල්ලෙකන්දෙගේ සමන්තා" යනුවෙන් ලියා පී. සමන්තා / ප. සමන්තා කෙලෙමි), (පහල) පල්ලෙ මහය්යාව, (පහල) පල්ලෙගම යන තැන්වල පහල ම පල්ල / පල්ලෙ වී ඇත.

නියම විදියට නම් පහළ - පල්ළ විය යුතුය. මෑදද මුර්දප් අකුරු පල්ල ගිල් උන තැනකි.

දෙලහ - උඩහ සහ පල්ලහ (පල්ලෙහා)

"තොරණ ලස්සනය් - තොරන් දෙකම ලස්සනය්" යනුවෙන් එක් තැනක මුර්දප් "ණ" යන්න වෙනත් තැනක දන්තප් "න" යන්න කල හැකි වියරන රීතියක් මා ඉගෙන ගෙන නැත. පොල්ලෙලි වළ ඊයෙ ගොඩ කලා "පුංචි කාලෙ අපි නමවල් පෙරලු හැටි තාම මතකයි. මෙහි ද එක් තැනක මුර්දප් "ළ" යන්න වෙනත් තැනක දන්තප් -ල" කල හැකි වියරන රීතියක් ද මා ඉගෙන ගෙන නැත.

"අග්ගළා" යනුවෙන් පොත්වල දක්නට ලැබෙන කැවිල්ල ඔබ හඳුනති. අතින් ගුලි කොට හඳන ගලක් මෙන් තද කැවිල්ල - අත් ගල - අග්ගල - අග්ගළා" වී ඇතැයි සිතමි. එක්තරා උගතකු - අක්ශර විත්‍යාසය" පැහැදීම සඳහා ලියා ඇති - සිංහල අක්ෂර විත්‍යාස අකාරාදිය" යන පොතේ ඒ වචනය ලියා ඇත්තේ "අග්ගළා" යන විදියටයි.

දෙගිවල, කොනුවල, දෙදියවල, රතුපස්වල, බේරුවල, රන්වල, ඔඩවල යන තැන් වල ඇත්තේත් පල්ල ගිල් උන -ළ" යන්නයි.

නාම පදයකට ප්‍රත්‍ය එකතු කොට හඳ ගන්නා ගම(යා) - ගැමි(යා) - දැහැමි(යා), නැකති(යා), පනතා(ව), නිහඬතා(ව), නිහැඩියා(ව) ආදි පද තද්ධිත පද යනුවෙන් වියරන පොත්වල සඳහන්ය. කුමාරතුංග පඩිතුමා ඒ පද හඳුන්වන්නේ "සංග්‍රහ නාම" යනුවෙනි. (නාම ප්‍රත්‍ය) සංග්‍රහ නාම නිපද-වන ප්‍රත්‍ය විසි තුනක් එතුමා දැක ඇත. "අළ" යනු ඉන් එකකි. ඉස් අළ = ඉහළ, පා අළ = පාළ - පහළ යන දෙපදය හැදී ඇත්තේ එකී "අළ" ප්‍රත්‍යය එකතු වීමෙනි. ඒ දෙපදය ඇරෙන්නට "අළ" ප්‍රත්‍යය එකතු වී හැදෙන වෙනත් පදයක් සොයාගත නොහැකි විය.

කොර-ළ, අඩ-ළ, හිත-ළ, අස-ළ, බහු-ළ, වනවාස-ළ, සිහ-ළ, ආරච්චි-ළ, යන වචනවල ඇත්තේ -අළ" ප්‍රත්‍යය නොවන බව මගේ හැඟීමයි. එතුමාගේ දැන උගත්කම මගේ දැන උගත් කමට සමාන කිරීමට සීගිරි ගලත් කුසටරාජ ගලත් උපමාවක් සෙස ගත හැකිය. එහෙත් මේ මා දකින සැටිය.

"අනේ මේ දරු පාටිය:ගෙ උහත! බලාපල්ල:කො අර මිනිහ:ගෙ මහත!" යන පදවල ඇත්තේ උහ-ත, මහ-ත යනුවෙන් අගට එකතු වූ -ත" යන්නකි.

"කහ දියර බාජනේ ඉහිරුනා. උඳ වූ නව වසර කාට කාටත් හොඳ වගෙයි." මේ පදවල දිය-ර, වස-ර යනුවෙන් අගට එකතු වූ -ර" යන්නක් පෙනේ. කුස/කුහ-ර යන්නද එසේ හැඳුනු පදයක් ලෙස සැලකිය හැකිය.

වියරන පොතේ කියන්නේ ප්‍රකෘතියට ප්‍රත්‍ය එකතු වන බවයි. ඉහ-ත, ඉහ-ළ, පා-ත, පා-ළ, මුන-ත, නලළ-ත, කන-ත, වරළ-ස, මුහුළ-ස, සිසිළ-ස වැනි තැන් වල ඇති 'ත' යන්නත් 'ස' යන්නත් ඒ ගොඩට දැමිය හැකිය.

කිතුනු පල්ලියේ -යාචිඤ්ඤ කරමුව - ගායනා කරමුව යන පද කීමේ දී දිවට පහසුවීම සඳහා 'ව' යන්නක් එකතු කරතැයි සිතමි.

උඹ මාව රැවටුවා, මං තෝව හම ගහනවා, ඔබව සොයා ආවා වැනි තැන්වල ඇති 'ව' යන්න ද එබඳුය.

කීමේ බිහිමේ පහසුව නිසා සමහර පදවලට අකුරක් එකතු කිරීමත් සාමාන්‍ය සිද්ධියකි.

(කන්නේ නෑ) කන්නෑ, (දන්නේ නෑ) දන්නෑ, (යන්නේ නෑ) යන්නෑ යන තැන්වල අකුරක් හලන්නේත් කීමේ පහසුව නිසාය.

(මේ ලිපියේ දෙවන කොටස ඊලඟ සන්නසේ)

හේමාල් ජයවික්‍රම ගේ "මනුලි"

රසික සූරියආරච්චි

ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන විප්‍රවාසී සිංහල ලේඛකයින් විසින් බිහිකරනු ලබන විදාමික සිංහල සාහිත්‍යය, ප්‍රධාන ප්‍රවාහයේ සිංහල සාහිත්‍යයේ එක් ප්‍රධාන අනු කොටසක් බවට දැන් පත්වෙමින් පවතී. මෙහි ලා ඕස්ට්‍රේලියානු සිංහල ලේඛකයින්ගෙන් කෙරෙන සම්මාදම ඉතා විශාල එකක් බව මගේ අදහසයි. ඕස්ට්‍රේලියානු සිංහල ලේඛකයින් බහුතරය වාසය කරන්නේ සිඩ්නි නුවර බව අප බොහෝ දෙනා තවමත් නොදන්නා කරුණකි.

මේ මා සරසෙන්නේ නොබෝද ඒ පිරිස අතරට එකතු වූ හේමාල් ජයවික්‍රම ගේ ප්‍රථම නවකතාව වන "මනුලි" පිළිබඳ විවරණයක යෙදෙන්නටයි. පේරාදෙනිය සහ මෙල්බර්න් විශ්ව විද්‍යාලවලින් උපාධි ලැබූ හේමාල් ව්‍යාත්තියෙන් සිවිල් ඉංජිනේරුවෙකි. සිඩ්නි නුවර සිංහල ජනකොටස තුල ඔහු ප්‍රසිද්ධියක් උසුලන්නේ ගායකයෙකු ලෙසය. නිව් සවුත්වේල්සයේ සංස්ථාපිත සිංහල සංස්කෘතික හමුව මගින් ප්‍රකාශනයට පත් කරන සිංහල සඟරාවට කෙටි කතා සහ කාව්‍ය නිර්මාණ සපයා ඇති හේමාල් ජයවික්‍රම මෙලෙස "මනුලි" සමගින් නවකතාකරණයට පිවිසීම සතුටට කරුණක් වේ.

ඕස්ට්‍රේලියානු සිංහල සාහිත්‍යය දෙකොටසකට බෙදී විමසිය හැකි බව මගේ අදහසයි. ඉන් පළමුවැන්න නම් විදාමික සිංහල ලේඛකයින් විසින් ඕස්ට්‍රේලියානු පරිසරය පසුබිම කොට කරන නිර්මාණ වේ. ප්‍රධාන ප්‍රවාහයේ සිංහල සාහිත්‍යයට උපරිම සම්මාදම අපට ලබා දිය හැක්කේ මේ ආකාරයේ නිර්මාණයන්ගෙන් බව අවිවාදාත්මකය. පෙර කී දෙවන ප්‍රවර්ගය නම්, මෙරට වෙසෙන ලේඛකයින් විසින් ලංකාව පසුබිම කරගෙන කරනු ලබන සාහිත්‍යය නිර්මාණයි. හේමාල් ජයවික්‍රම ගේ "මනුලි" අයත්වන්නේ මේ දෙවෙනි කොටසටයි.

මේ දෙවෙනි ආකාරයේ නිර්මාණ විදාමික සිංහල සාහිත්‍යය අනු-අංශයේ ලා වර්ගීකරණය කළ හැකි ද, ඒ සමගම මෙවැනි කෘති මගින් ප්‍රධාන ප්‍රවාහයේ සිංහල සාහිත්‍යයට කවර සුවිශේෂී දායකත්වයක් සැපයෙන්නේ ද යනු අප සලකා බැලිය යුතු කරුණු කිහිපයකි.

වසර 2007 දී සිංහල සංස්කෘතික හමුව මගින් ඕස්ට්‍රේලියානු සිංහල ලේඛකයින් ගේ සංක්‍රමණික අත්දැකීම් මත පදනම් වූ කෙටිකතා එකතුවක් " තිරය තරණ" නමින් සම්පාදනය කෙරෙන අවදියේ දී මේ පිළිබඳව තම අදහස පල කළ දයන්ත ජයරත්න කියා සිටියේ කලක් විදේශ රටක පදිංචි වී සිටි අයෙක්, මුළුමනින් ම ශ්‍රී ලංකාවේ පරිසරය පසුබිම කොට ගෙන කරන නිර්මාණයක වුවද, තමා වෙසෙන පරිසරයෙන් උකහා ගන්නා කරුණු නිරායා-සයෙන් ම ඇතුළත් වීම සිදුවන බවත්, මේ නිසාම, මේ ප්‍රවර්ගයේ නිර්මාණ කෘතිවලත් ශ්‍රී ලාංකික නිර්මාණකරුවෙකු ගේ කෘතියක දක්නට නොලැබෙන යම් යම් සුවිශේෂී ලක්ෂණ ගැබ්ව තිබෙන බවත් ය.

ඇත්ත වශයෙන්ම, -මනුලි" නවකතාවේ මේ ආකාරයේ සුවිශේෂී විදාමික ලක්ෂණ ගණනාවක් ම දක්නට තිබේ. ඒ ලක්ෂණ සමහර විට නිරායාසයෙන් ඇතුළු වී ඇති දේ විය හැක. රචකයා විසින් ඒ කරුණු උවමනාවෙන් ම ඇතුළත් කළා වීමට ද ඉඩ තිබේ. නවකතාව කියවීමේ දී ඔබට මේ විදාමික ලක්ෂණ හමුවෙනු ඇත. ඒ සමගම, අප සැමදෙනා හේමාල් ජයවික්‍රම මෙන්ම කාලයක් තිස්සේ ඕස්ට්‍රේලියාවේ වාසය කරන්නන් වීම නිසා, මේ කරුණුවල සුවිශේෂීත්වයක් නොපෙනීමට ද ඉඩ තිබේ. එසේ වුවද, ලාංකික රසිකයෙකු ට නම් මේ කරුණු යම් කිසි ආකාරයක නොගැලපීමක් ද මතු කරමින් ඇස ගැටෙනු ඇති බව මගේ අදහසයි.

සාහිත්‍යමය නිර්මාණයන් හි බොහෝ දුරට අඩංගු වන්නේ රචකයාගේ ප්‍රාථමික හෝ ද්විතීය අත්දැකීම් වේ. තමන් ගේ අත්දැකීම්වලට වඩා මුළුමනින්ම පරිබාහිර පසුබිම-ක් හෝ වස්තුබීජ හෝ පදනම් කරගෙන නිර්මාණකරනයේ යෙදෙන්නෝ ද සිටිති. හේමාල් ජයවික්‍රම තම -මනුලි" ප්‍රභන්ධය සඳහා මූලික වස්තු බීජ සපයා ඇත්තේ, දරුවන් මුදලට විකිණීම, පාතාල ලෝකයේ අවි ජාවාරම් සහ මෙහෙනි සස්න යන, මා සිතන අයුරින්, ඔහුට කෙලින්ම අත්දැකීම් නොමැති කාරණා කිහිපයකි.



මෙවැනි ප්‍රබන්ධයක් රචනාකරන නවකතාකරුවා ට, තම නිර්මාණය සැබෑ ලෝකයට පරිබාහිරව තිබෙන සංසිද්ධීන් මාලාවක් පමණක් වීමේ අනතුරෙන් මුදවාගෙන යතාර්ථයට හැකිතාක් දුරට සමීප කිරීමට අවශ්‍යතාවයක් ඇතිවේ. එසේ නොවුණු විට, පාඨක චිත්ත සන්තානය තුල නිර්මාණය පිළිබඳව ඇතිවන්නේ අවිශ්වාසයකි.

මේ අවශ්‍යතාව හොඳින් හඳුණාගෙන, ඒ සමගම, ඒ සඳහා නිර්මාණකරුවෙකු ට උපයෝගී කරගැනීමට ඇති විධික්‍රම මැනවින් ග්‍රහණය කරගෙන ඇති හේමාල් ජයවික්‍රම, තම නිර්මාණයේ දී එහි කතා වස්තුවට පරිසරය වී ඇති ශ්‍රී ලංකාවේ තත්කාලීන සමාජමය සංසිද්ධීන් හැකි සෑම තැනම අවශ්‍යය පරිදි සාර්ථකව යොදු ගෙන ඇති බව පෙනේ.

කුප්‍රකට සුදු වෑන් වලින් ගමන් බිමන් යමින් සාක්ෂි සපයන්නන් එක්කෝ අනවශ්‍ය පරිදි බියගන්වා හෝ නැතිනම් සටකපටකම් මගින් රවටා හෝ විවිධ ආර්ථික වාසි ලබා ගන්නා පොලිස් නිළධාරීන්, අමානුශික ළදරු ජාවාරම මෙහෙයවන දේශපාලඥයින්, පක්ෂග්‍රාහීව, හිතවත්කම් මත පදනම්ව සහ ඊටත් වඩා තුන්වන සහ පස්වන සිල්පද කඩමින් ක්‍රියාත්මක වී දේශපාලකයින් නිදහස් කරගන්නා පොලිස් නිළධාරීන්, මේ ප්‍රබන්ධයේ එන චරිත කිහිපයකි. ඔවුන් වටා ගොඩ නැගෙන සංසිද්ධීන් මගින් මේ ප්‍රබන්ධය ඉතා අගනා අයුරින් තාත්වීයකරණය කර ඇත.

"මනුලි" නවකතාවේ එන පුවත්පත් කලාවේදිනිය ගේ ඝාතනය මා සිත සසල කළේ ය. අප දන්නා පරිදි පසුගිය දශක දෙකක පමණ කාලය ඇතුලත ලංකාවේ පුවත්පත් කලාවේදීන් විසි දෙනෙක් පමණ ඝාතනය කර තිබේ. මීට අමතරව, පසුගිය වසර පහක පමණ කාලය තුල පැහැරගෙන ගොස් වද හිංසන වලට ලක් කරන ලද පුවත්පත් කලාවේදීන් සංඛ්‍යාව පනහ ඉක්මවයි. මින් බොහෝ දෙනෙකුට තම ජීවිත ආරක්ෂාව පතා රටින් පැන යාමට සිදුවී ඇත. ලංකාව පසුබිම් කොට ගෙන රචනා කෙරෙන ප්‍රබන්ධයක් තාත්වීයකරණය කිරීමට උපයෝගී කරගත හැකි මෙයට වඩා වෙනත් තත්කාලීන සත්‍යයක් තවත් නොමැති තරම් ය.

මා දකින ආකාරයට, හේමාල් ජයවික්‍රම ලියූ " මනුලි" නවකතාව, රචකයෙකුගේ ප්‍රථම නිර්මාණයකට වඩා ඉතා ඉහළින් පවතින්නකි. මේ ප්‍රබන්ධය ගොඩ නගා ඇති ආකාරය, චරිත නිර්මාණය, දෙබස් සහ භාෂා රටාව ගැන සලකන විට ඉස්මතු වී පෙනෙන්නේ නවකතාකරුවා ගේ පරිනතභාවය සහ කුසලතාවයි. මෙම කෘතියේ පසුවදනේ ද සඳහන්වෙන පරිදි, දීර්ඝ කාලයක් තිස්සේ සාහිත්‍ය නිර්මාණ ඇසුරින් හේමාල් ජයවික්‍රම ලබා ඇති පරිචය "මනුලි" නවකතාවෙන් හොඳින් විදහා දක්වේ යැයි මම සිතමි. ■